# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.සේනානායක පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : **2556629** ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/ලේකම්/199/20 ඔබේ අංකය :

2020.10.14

සී.ඩී. වික්‍රමරත්න මහතා,
වැඩබලන පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**<u>කොරෝනා වසංගත සමයේ පොලිස් නිලධරයන්ගේ ප්‍රවාහන පහසුකම් සම්බන්ධව.</u>**

කොරෝනා වසංගතය අප රටතුල වාර්තාවූ පළමු වකවානුවේදී පොලිස් නිලධරයන් පොදු ප්‍රවාහන සේවය භාවිතා කිරීමෙන් සිදුවිය හැකි කොරෝනා වෛරසය පැතිරීමේ අවදානම හේතුවෙන් ප්‍රධාන නගරයන් වල සිට පොලිස් මූලස්ථානය දක්වා රාජකාරී සඳහා පැමිණෙන නිලධරයන් හට ප්‍රවාහන සේවාවක් ආරම්භ කිරීමට කටයුතු කිරීම පිළිබඳව ඔබතුමා වෙත අප සංගමයේ ස්තුතිය පුදකර සිටින්නෙමු.

නැවතත් රටතුල කොරෝනා දෙවන රැල්ලක් මතුවී, දැනට දිවයිනේ නගර / ප්‍රදේශ කිහිපයක වාර්තාවී ව්‍යාප්ත වෙමින් පවතින අතර, පොලිස් නිලධරයන් පොදු ප්‍රවාහන සේවය භාවිතා කිරීම තුලින් සෞඛ්‍ය ගැටළු වලට මුහුණු දී කොරෝනා වෛරසය පැතිරීමේ අවදානමක් මතුව ඇත.

එබැවින් පෙර පරිදිම දිවයිනේ ප්‍රධාන නගරවල සිට පොලිස් මූලස්ථානය හා ඊට සමගාමීව පිහිටා ඇති ක්‍රියාකාරී කොට්ඨාශයන්හි රාජකාරී පැමිණෙන පොලිස් නිලධරයන් සඳහා ප්‍රවාහන පහසුකම් ආරම්භකරන ලෙස ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

**නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි**
**නීතිවේදී (ගෞරව)**
**ගරු ලේකම්.**
**ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය**

**අභිමානවත් පොලිසියක් ගොඩනගමු.**